කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/I2    ඔබේ අංකය / உமது எண் / Your No:    දිනය / திகதி / Date: 2019.09.04

කළමණාකාර අධ්‍යක්ෂ,
බ්‍රවුන්ස් ඇග්‍රි සොලුයුෂන්ස් (පුද්.) සමාගම,
34, සර් මෙහොමඩ් මැකන් මාකර් මාවත,
කොළඹ 03.

හිතවත් මහතාණෙනි,

**<u>වැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 57.6% ඩබ්.ඩී.ජී. දිලීරනාශකයේ අලෙවිය සම්බන්ධවයි</u>**

ඔබ සමාගම විසින් ලියාපදිංචිය ලබා ඇති ඉහත දිලීරනාශකය මේ වන විට නිර්දේශ කරනු ලබන්නේ තේ වගාව සඳහා භාවිතයට පමණි (බිබිලි අංගමාර රෝග තත්ත්වය පාලනය සඳහා). නමුත් මෙම කාර්යාලයේ නිලධාරීන් විසින් සිදු කරන ලද අලෙවිසැල් පරීක්ෂාවල දී මෙම දිලීරනාශකය තේ වගාව සිදු නොකරන වියලි කලාපීය ප්‍රදේශවල අලෙවිසැල් වෙත අලෙවිය සඳහා මුදාහැර තිබෙන බවට නිරීක්ෂණය කර ඇති අතර මේ සම්බන්ධව විවිධ ප්‍රදේශවලින් ද පැමිණිලි ලැබෙමින් පවති.

02. ඒ අනුව තේ වගාව නොපවතින සහ වියලි කලාපයට අයත් සියළු දිස්ත්‍රික්කවල පළිබෝධනාශක අලෙවිසැල් වෙත මේ වන විට නිකුත් කර ඇති එම දිලීරනාශක (ගබඩාවල ඇති සහ අලෙවිය තබා ඇති) සති 02 ක් ඇතුලත ඉවත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහන් වාර්තාවක් මා වෙත නොපමාව එවීමට කටයුතු කරන මෙන් ද දන්වා සිටිමි.

03. 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ විධිවිධාන කඩ කිරීම එකී පනත යටතේ අවශ්‍ය යැයි හැඟෙන දණ්ඩණයන්ට යටත් විය හැකි බව ද අවධාරණය කරමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත්:
1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
2. සියළුම බලයලත් නිලධාරීවරුන් - කා.දැ.ස.අ.ක.ස.

ඔබගේ, ඔබගේ ආදරනීයයන්ගේ, මුළු මහත් සමාජයේ සහ වන සත්ත්වයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වගකීමෙන් යුතුව පළිබෝධනාශක භාවිතා කරමු
உங்களதும், உங்கள் அன்புக்குரியவர்களினதும், முழு சமூகத்தினதும் மற்றும் எல்லா உயிரிணங்களினதும் பாதுகாப்பை உறுதி செய்வதற்காக பீடைநாசினிகளை அவதானத்துடனும் பொறுப்புடனும் பாவனை செய்வோம்
Let's act together to protect you, your loved ones, entire society & wildlife by responsible use of pesticides